## අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

# ප්‍රසම්පාදන දැන්වීම

# 2022 වර්ෂය වෙනුවෙන් පාසල් පෙළපොත් ප්‍රවාහනය කිරීම

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් කාර්යය සඳහා බස්නාහිර පළාතේ පදිංචි සැපයුම්කරුවන්ගෙන් 2021.09.28 දක්වා මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ.

01. පාසල් පෙළපොත් ප්‍රවාහනය - 2022 ලංසු අංකය - අප්‍රදෙ/මු08/02/ප්‍රවාහනය/2021

02. ඉහත සඳහන් ලංසුව සඳහා මිල ගණන් 2021.09.07 වන දින සිට 2021.09.27 වන දින සවස 3.00 දක්වා නිකුත් කරනු ලබන අතර, ආපසු නොගෙවන රු. 3,000/- ක ගාස්තුවක් **බත්තරමුල්ල, පැලවත්ත, "ඉසුරුපාය"** හි පිහිටි අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ **"අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්"** නමට ගෙවා ලබාගන්නා ලද ලංසු ලියවිලිවල පමණක් ලංසු ඉදිරිපත් කළ යුතුය.

03. ලංසු පත්‍රිකා ලබා ගැනීම සඳහා පහත සඳහන් ලියවිලි ඉදිරිපත් කළ යුතුය.

   I. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් නමට ආපසු නොගෙවන රු. 3,000/- ක ගාස්තුවක් ගෙවන ලද බවට ලබාගන්නා ලද ලදුපත සහ

   II. පිටුපස දොරවල් අගුළු දමා වැසිය හැකි, සම්පූර්ණයෙන්ම ආවරණය කරනලද පහත දක්වා ඇති බර පංතිවලට අයත් ලොරි රථ සහ වෑන් රථවල අයිතිය තහවුරු කිරීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරනු ලබන මෝටර් රථ ලියාපදිංචි කිරීමේ සහතික (ඡායා පිටපත් සහිතව)

| | |
|---|---|
| තාර බර ටොන් 4.2 හෝ ඊට වැඩි ලොරි රථ | අවම වශයෙන් ලොරි රථ පහක අයිතිය ප්‍රවාහන ආයතනයේ නමට හෝ ප්‍රවාහන ආයතනයේ හිමිකරුගේ නමට තිබිය යුතුය. |
| තාර බර ටොන් 4.2 ට අඩු තාර බර ටොන් 2.5 දක්වා ලොරි රථ | අවම වශයෙන් ලොරි රථ පහක අයිතිය ප්‍රවාහන ආයතනයේ නමට හෝ ප්‍රවාහන ආයතනයේ හිමිකරුගේ නමට තිබිය යුතුය. |
| තාර බර ටොන් 2.5 ට අඩු ලොරි රථ | අවම වශයෙන් ලොරි රථ තුනක අයිතිය ප්‍රවාහන ආයතනයේ නමට හෝ ප්‍රවාහන ආයතනයේ හිමිකරුගේ නමට තිබිය යුතුය |

   III. ප්‍රවාහන ව්‍යාපාරයක් පවත්වාගෙන යන බවට ව්‍යාපාරය පවත්වාගෙන යන බල ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකය හෝ සමාගම් ලියාපදිංචි කිරීමේ සහතිකය. (ඡායා පිටපතක්ද සමග)

04. මුද්‍රා තබන ලද ලංසු ලියවිලි 2021.09.28 වන දින පෙ.ව. 10.00 ට පෙර බත්තරමුල්ල, පැලවත්ත, ඉසුරුපාය හි හයවන මහලේ පිහිටි අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී කාර්යාල කාමරයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලීම හෝ **සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය,** අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, **"ඉසුරුපාය"**, පැලවත්ත, **බත්තරමුල්ල** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. (කවරයේ ඉහළ වම් කෙළවරේ **"2022 වර්ෂය වෙනුවෙන් පාසල් පෙළපොත් ප්‍රවාහනය කිරීම"** යනුවෙන් සඳහන් විය යුතුය) ලංසු ලියවිලි පිටපත් දෙකක් මුල්පිටපත හා අනුපිටපත යනුවෙන් වෙන වෙනම කවර දෙකක බහා මුද්‍රා තබා එම කවර දෙක නැවත එක් කවරයක බහා මුද්‍රා තබා ඉදිරිපත් කළ යුතුය.

05. ලංසු භාරගැනීම අවසන් වූ පසු 2021.09.28 පෙ.ව 10.05 ට ලංසු විවෘත කිරීම අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ දී සිදු කරනු ලැබේ. මෙම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයකුට සහභාගි විය හැකිය.

06. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලයේදී 2021.09.07 දින සිට 2021.09.27 දින දක්වා සතියේ රාජකාරී දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ලංසු ලියවිලි මුදල් ගෙවීමකින් තොරව පරීක්ෂා කර බැලිය හැකිය.

07. වැඩිදුර විස්තර පහත සඳහන් දුරකථන අංක මගින් විමසා දැනගත හැකිය.

**011-2784815 - අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්**
**011-2787515 - ප්‍රධාන ගණකාධිකාරී**

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව,**
**"ඉසුරුපාය", පැලවත්ත,**
**බත්තරමුල්ල.**
**2021.09.07**